කන්තලේ ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 04 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 30 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු. 123,095 ක් වූ පුස්තකාල පොත් 385 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු මුදල රු. 262,228 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 204,960 ක් ලෙස දැක්වීමෙන් ජංගම වගකීම් රු. 57,268 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්
------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධිවිධානවලට අනුකූල නොවීම් විග්‍රහ කර පහත දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 216,524 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ආ) 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව

| | |
|---|---|
| (ii) 141 වන රීතිය | 2016 වර්ෂය සඳහා තැන්පතු ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි |
| (ii) 217 වන රීතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,959,735 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 90,206 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,869,529 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව කුලී ආදායම රු. 3,473,533 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,869,529 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 වර්ෂය | | |
|---|---|---|---|
| ආදායම් විෂය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,800 | 3,607 | 9,573 |
| බදු කුලී | 7,730 | 6,512 | 1,959 |
| බලපත්‍ර ගාස්තු | 1,103 | 915 | - |
| වෙනත් ආදායම් | 45,648 | 38,631 | 9,080 |

2.2.2 මුද්දර ගාස්තු

---------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 හා 2016 වර්ෂයන්ට අදාලව මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගෙන ලබා ගැනීමට 2017 ජූලි 18 දින වන විටද කටයුතු කර නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

සභා බල ප්‍රදේශයේ පවතින වරිපනම් කොට්ඨාශ 06 හි වරිපනම් ඒකක 182 කට අදාලව රු. 3,540,683 ක වරිපනම් මුදල් අයකර ගැනීමට සභාව විසින් 2017 ජූලි 18 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු කඩ කාමර කුලී මුදල් වූ රු. 1,917,004 ක් වර්ෂ 06කට ආසන්න කාලයක් හිඟව පැවති අතර, එම මුදල් අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් 08 දෙනෙකු හා ක්ෂේත්‍ර කම්කරුවන් 03 දෙනෙකු සඳහා කාර්යය පැවරුම් විස්තර ( Duty List) ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් ඔවුන් විසින් ඉටු කරන ලද වැඩ පිළිබඳ නිවැරදි තහවුරුවක් ලබා ගැනීමටත් කාර්යයන් ඉටු කිරීම පිළිබඳව පාලනයක් පවත්වා ගැනීමටත් නොහැකි වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවතින වීදි පහන් ප්‍රමාණය හා ඒවා අලුත්වැඩියා කිරීම සම්බන්ධ තොරතුරු වාර්තා කිරීමට ලේඛනයක් සභාව නඩත්තු කර පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් වීදි පහන් මිලදී ගැනීම හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් පාලනයක් පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) සභාවේ සේවයේ නියුතුව සිට සේවය හැරගිය හා සේවයෙන් ඉවත්කල සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 1,205,400 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු රථවාහන 13 ක් සඳහා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව ධාවනයේ පවතින වාහන 10 ක් සඳහා දෛනික ධාවන සටහන් නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි.

(උ) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති සැලසුම් චක්‍රලේඛ අංක 15 අනුව අනවසර ඉදිකිරීම් සඳහා වූ සේවා ගාස්තු අය කිරීම් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ගිණුමක් විවෘත කර එයට බැර කළ යුතු වුවත්, සභාව විසින් රු. 959,350 ක මුදලක් පොදු ගිණුමේ තැන්පත් කර තිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

i. සභාවේ පහත සඳහන් තනතුරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබුණි.

| තනතුරෙහි ස්වභාවය | අනුමත ප්‍රමාණය | තත්‍ය ප්‍රමාණය | වැඩිපුර සිටින ප්‍රමාණය |
|---|---|---|---|
| කළමනාකරණ සහකාර | 10 | 11 | 01 |
| රියදුරු | 06 | 08 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 03 | 04 | 01 |
| මුරකරු | 03 | 06 | 03 |
| පුස්තකාල සේවා සහායක | 02 | 03 | 01 |
| එකතුව | **24** | **32** | **08** |

ii. රියදුරු සහ පුස්තකාල සේවා සහායක යන තනතුරු සඳහා සේවකයන් අතිරික්තව සිටියදී එම තනතුරු සඳහා අනියම් පදනම මතද සේවකයින් බඳවාගෙන තිබුණි.

iii. සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂක, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක යන තනතරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2017 ජුලි 18 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපලේ කඩකාමර 66 ක් සහ බස්නැවතුම්පලේ කඩකාමර 24 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් සම්පූර්ණකර 2013 මාර්තු 27 දින ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් දෑ නිරීක්ෂණය විය.

i. පොදු වෙළඳපොල තුල කඩකාමර 1-6 දක්වා රෙදිපිලි වෙළඳාම, 6 සිට 12 දක්වා සිල්ලර, 13-25 දක්වා එළවලු ,26-35 දක්වා පලතුරු සඳහාද යනාදි ලෙස වෙන් වෙන් වශයෙන් බදු දීමට තීරණය කර තිබුණි. මේ අනුව ලැබී තිබූ ඉහල ටෙන්ඩර් මිල ගණන් ප්‍රතික්ෂේප කර අඩු මිල ගණන් වලට කඩ කාමර ලබා දී තිබුණි. කෙසේ වුවද, එවැනි වර්ගීකරණයකට අනුව කඩ කාමර ලබා දී නොතිබුණු අතර, අඩු මිලට කඩ කාමර ලබා දීමෙන් සභාවට මාසිකව රු. 60,000 ක පමණ මුදලක් අහිමි වී තිබුණි.

ii. පොදු වෙලඳපලෙහි ඉහළ මහලය වෙත ප්‍රවේශ වීමේ අපහසුව, එම කඩ කාමරවල තැන්පතු වටිනාකම වැඩිවීම හා අනවසර කඩ කාමර පැවතීම හේතුවෙන් කඩ කාමර 26 ක් කුලියට ලබා දීමට නොහැකිව නිෂ්කාර්යව පැවතීම නිසා වාර්ෂිකව සභාවට රු. 600,000 කට ආසන්න මුදලක් අහිමි වී තිබුණි.

iii. බස්නැවතුම්පලෙහි පවතින කඩකාමර සඳහා තැන්පතු මුදල් ගෙවූ පුද්ගලයින්ට 2017 මැයි මස කඩකාමර ලබා දී තිබුණද, විදුලිය ලබා නොදීම හේතුවෙන් වෙළෙඳ කටයුතු 2017

ජූලි 18 දින වන විටද ආරම්භ කර නොතිබුණි. මේ හේතුවෙන් ජුනි මාසයට අදාල කුලි මුදල වූ රු. 95,800 ක් අහිමි වී තිබුණි.

iv. බස්නැවතුම්පල කඩකාමර ඉදිකිරීම් සියල්ල සම්පූර්ණ කර කොන්ත්‍රාත්කරු විසින් සභාව වෙත 2013 මාර්තු 27 ලබා දී තිබුනද, සභාව මගින් එම කඩකාමර සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා නොදීම මත රු. 102,000 කට ආසන්න වටිනාකමක් සහිත විදුලි උපාංග නැති වී තිබු අතර එම උපාංග නැවත සවිකිරීම සඳහා සභාව විසින් අමතර වියදමක් දරා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ අග්බෝපුර පුස්තකාලයට අලුත් පොත්පත් ලබා ගැනීමට , සාමාජිකයින්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමට හෝ පුස්තකාල කටයුතු ප්‍රවර්ධනයට අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, මාසිකව පොත් ලබා ගැනීමට සාමාජිකයින් 5-10 ත් අතර ප්‍රමාණයක් පැමිණෙන අතර, සාමාජික නාම ලේඛනය අනුව පසුගිය වර්ෂ 03 ඇතුලත සාමාජිකයින් 13 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. කෙසේ වුවද, පුස්තකාලය පවත්වා ගෙන යාමට සේවකයන් 04 දෙනෙකු අනුයුක්ත කර ඇතත් පුස්තකාලය මගින් ඵලදායී සේවයක් එම ප්‍රදේශයේ ජනතාවට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) කන්තලේ ප්‍රාදේශීය සභාවට අයත් වෙන්ඩ්‍රාසන්පුර ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ 2016 වර්ෂයේ සාමාන්‍යයෙන් දිනකට රෝගීන් 10 කට පමණ ප්‍රතිකාර කර තිබුණි. එහෙත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිකාර කරනු ලබන රෝගීන් ප්‍රමාණය පිළිබඳ සැලකිල්ලට නොගෙන අනුමත වෛද්‍යවරු දෙදෙනෙක් හා ඖෂධ සංයෝජකවරුන් දෙදෙනෙක් අනුයුක්ත කර තිබීමෙන් ඔවුන්ගෙන් ඵලදායී සේවයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**3**.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

**3**.4.1 බහු කාර්යය ගොඩනැඟිල්ල ඉදිකිරීම

--------------------------------------------

ප්‍රාදේශිය සභාව විසින් 2014 මාර්තු 18 දින රු. 51,093,960 ක කොන්ත්‍රාත් වටිනාකමකට බහුකාර්යය ගොඩනැඟිල්ලෙහි පළමු පියවර වෙනුවෙන් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) බහු කාර්යය ගොඩනැගිල්ලෙහි In floor Slab සහ In Floor Beam ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද Plywood Shutter නිසි ප්‍රමිතියෙන් තොර පරණ ඒවා යොදා ගැනීම හේතුවෙන් Slab එකෙහි මතුපිට සුමට ලෙස නිමකර නොතිබුණි. එහෙත් මෙහි වැඩ සතුටුදායක ලෙස නිමකර ඇති බවට නිර්දේශ කර රු. 10,463,048 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) Slab එක මත කපරාරුව සහ තීන්ත ආලේපය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ මුදල රු. 312,650ක් විය. එහෙත් Slab එක නිසි පරිදි නිම නොකිරීම හේතුවෙන් කපරාරුව සිදු කිරීමට නොහැකි වී තිබුණි. මේ සඳහා සිවිලිමක් සවිකර තිබුණු අතර, ඒ වෙනුවෙන් රු. 1,046,750 ක මුදලක් ගෙවා තිබුණි. මේ සඳහා අතිරේකව දරන ලද පිරිවැය පළමු කොන්ත්‍රාත්කරුගෙන් ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4..2 ප්‍රාදේශිය සහ ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

උක්ත වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී සභාව විසින් ආරම්භ කර තිබූ එකතුව රු.2,677,008 ක් ඇස්තමේන්තු වටිනාකමකින් යුත් පොදු වෙළඳපොල රථගාලෙහි කොන්ක්‍රීට් ගල් ඇතිරීම, 93 හන්දියේ සතිපොළ අළුත්වැඩියා කිරීම හා කන්තලේ වැව් බැම්ම අසල පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම යන ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කන්තලේ පොදු වෙළඳපොල තුල ඇති රථ ගාලෙහි කොන්ක්‍රීට් ගල් ඇතිරීම සඳහා රු. 1,148,500 ක ඇස්තමේන්තු වටිනාකමක් මත වැඩ ආරම්භ කර වර්ග මීටර 534 ක පමණක් ගල් අතුරා තිබුණු අතර, වර්ග මීටර 365 ක පමණ ප්‍රමාණයක ගල් ඇතිරීමට ඉතිරිව පැවතියද 2017 ජූලි 18 වන විටද එහි කටයුතු නිම කර නොතිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 01/2016 දරන චක්‍රලේඛයෙහි ඡේද අංක 4.1 හා 4.3 ට අනුව උක්ත වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති සභාව විසින් ශ්‍රමය හා උපකරණ යොදා සිදුකල යුතු වුවද, එයට පටහැනිව 93 හංදිය සතිපොළ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රජා මණ්ඩලයක් වෙත 2016 අගෝස්තු 10 දින රු. 999,224 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ වෙනුවෙන් ප්‍රජා මණ්ඩලය වෙත රු. 436,074 ක මුදලක් ගෙවා තිබුණු නමුත් මෙහි වැඩ 2017 ජූලි 18 දින වන විටද නිමකර නොතිබුණි.

(ඇ) මෙම වැඩසටහන යටතේ කන්තලේ වැව් බැම්ම අසල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 529,284 ක් වටිනා ඇස්තමේන්තු වටිනාකමක් මත අලුත්වැඩියා කටයුතු ආරම්භ කර තිබුණි. මෙහි බිත්ති සකස් කොට කපරාරු කර තිබූ නමුත් ජල සැපයුම ලබා ගැනීම සහ වැසිකිලි පද්ධතියේ ඇතුලත නිම කිරීමට 2017 ජූලි 18 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.5 පාරිසරික ගැටළු

පරිසර බලපත්‍ර නිකුත් කිරීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුකූලව පාරිසරික හානි සිදුවන වඩු කර්මාන්ත, බ්ලොක් ගල් නිෂ්පාදන කර්මාන්ත සහ වී මෝල් ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 35 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්තය කරගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 ගිණුම් කටයුතුභාවය හා වත්කම් කළමනාකරණය

වත්කම් කළමනාකරණය

(අ) ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. 1997 වර්ෂයේ දී මිලදී ගත් වෑන් රථය 2013 දෙසැම්බර් මාසයේ සිටද, 1987 වර්ෂයේ දී මිලදී ගත් ට්‍රැක්ටරයක් 2011 දෙසැම්බර් සිට ද, 2008 වර්ෂයේ දී මිලදී ගත් කැබ් රථය 2015 ජූනි මස සිටද ක්‍රියාවිරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2017 ජූලි 18 දින වන විටද ගෙන නොතිබුණි.

ii. ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහයෙන් පවත්වා ගෙන යනු ලැබූ නැණසල පරිගණක මධ්‍යස්ථානය 2015 වර්ෂයේ සිට වසා දමා තිබුණි. මේ හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු පරිගණක, ගෘහ භාණ්ඩ සහ අනෙකුත් උපකරණ නිශ්කාර්යව පැවති අතර, ග්‍රාමීය ප්‍රදේශයන්හි දරුදැරියන්ට සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------------------

2017 මාර්තු 25 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 07 ක් අළුත්වැඩියා කිරීමටත්, විකිණීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 28 ක් විකිණීමටත්, ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 10 ක් සහ පොත් 1316 ක් ඉවත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග 2017 ජූලි 18 දින වන විටද ගෙන නොතිබුණි.

3.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභා බල ප්‍රදේශය තුළ මාසිකව කසළ ටොන් 150 ක් පමණ බැහැර කරනු ලබන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසළ වෙන් වෙන් වශයෙන් බැහැර කිරීමක් හෝ නොදිරන අපද්‍රව්‍ය තුනීකර පස්දමා වැසීමක් හෝ සිදු කර නොතිබුණි.මේ හේතුවෙන් එම ප්‍රදේශයේ ගැවසෙන වන අලින් කසළ ආහාරයට ගැනීමට පුරුදු වී තිබීම නිසා මෙය වන අලින්ගේ පැවැත්මට තර්ජනයක් වී තිබුණි. කෙසේ වුවද, කසළ කළමනාකරණය සඳහා මහවැලි අධිකාරිය විසින් අක්කර 12 1/2 ක ඉඩමක් සූරියපුර ප්‍රදේශයෙන් ලබා දී තිබූ අතර, මෙම භූමිය වටා විදුලි වැටක් සවිකර විධිමත්ව කසළ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ප්‍රාදේශීය සභාව විසින් 2017 ජූලි 18 දින වන විටද ගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ගිණුම් තැබීම<br>ii. උපයෝගි ලෙජර් පවත්වා ගෙන යාම |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | i. වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම<br>ii. නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යන්වල යෙදවීමට කටයුතු කිරීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම<br>ii. ගිවිසුමට අනුකූලව කාර්යයන් ඉටු කිරීමෙන් පසු ගෙවීම් කිරීම. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | අතිරික්ත සේවකයන් බඳවා ගෙන තිබීම |